
# විෂයය - විද්‍යාව

## ශ්‍රේණිය - 8

## නිපුණතාව - 01

## නිපුණතා මට්ටම - 1.8

## පාඩම - 12, ජීවීන්ගේ ජීවන චක්‍ර



# ජීවීන්ගේ ජීවන චක්‍ර

**01.** ජීවන චක්‍ර හැඳින්වීම

**02.** මිනිසාගේ හා සමනලයාගේ ජීවන චක්‍ර සැසැඳීම

**03.** රූපාන්තරණය

**04.** සම්පූර්ණ හා අසම්පූර්ණ රූපාන්තරණය

**05.** සපුෂ්ප ශාකයක ජීවන චක්‍රය

**06.** පළිබෝධ මර්ධනය සඳහා ජීවන චක්‍ර අධ්‍යයනයේ වැදගත් කම

## ක්‍රියාකාරකම 01

**පහත ඡේදය හොඳින් කියවා එය තේරුම් ගැනීමට උත්සාහ කරන්න.**

පුතේ දුවේ, ඔබ 5 ශ්‍රේණියේ දී ජීවන චක්‍රයක් යනු කුමක් දැයි අසා දැන ගත්තා නේ ද? සමනලයා, මදුරුවා, කැරපොත්තා ආදී සතුන්ගේ ජීවන චක්‍ර ගැන ඔබ දැනටමත් ගොඩක් කරුණු දන්නවා ඇති. පෘථිවිය මත වාසය කරන සියළුම ජීවීන් ට ජීවන චක්‍රයක් පවතින බව මතක තබා ගන්න.

**ජීවියෙකු උපතේ සිට තම ජීවිත කාලය තුළ පසුකරන විවිධ අවධි හෝ අවස්ථා අනුපිළිවෙළ එම ජීවියාගේ ජීවන චක්‍රය ලෙස හැඳින්විය හැකිය.**

- ඔබේ පෙලපොතේ 12 වන පාඩමේ මුල් පිටු හතර කියවා ඔබට පහසුකම් පවතීනම් පහත වෙබ් ලිපින වලට පිවිස සතුන්ගේ ජීවන චක්‍ර අධ්‍යනය කරන්න.

01. https://www.youtube.com/watch?v=jivWeOrCaeI

02. https://www.youtube.com/watch?v=AMs3waaW75g

03. https://www.youtube.com/watch?v=wFfO7f8Vr9c

04. https://www.youtube.com/watch?v=XGOpeXgbsro

❖ සතුන් සිව් දෙනෙකු ගේ ජීවන චක්‍ර චචන ඊතල භාවිතයෙන් අඳින්න.


## ක්‍රියාකාරකම 02

**අවශ්‍ය ද්‍රව්‍ය -**


ජෑම් බෝතල් 01, අත්කාවයක්, කැරපොත්තෙකුගේ බිත්තර ගොනුවක්

**ක්‍රමය-**

පහත රූපයේ ආකාරයට ජෑම් බෝතලයට කැරපොත්තෙකුගේ බිත්තර ගොනුවක් හෝ ගොනු කිහිපයක් ඇතුළුකර විනිවිද පෙනෙන සිදුරු සහිත පොලිතීන් හෝ වීදුරු තහඩුවකින් ආවරණය කරන්න.



❖ පහත රූප සටහනේ ආකාරයට බිත්තර ගොනුව මගින් කැරපොතු ශිශුවන් බිහිවන ආකාරය නිරීක්ෂණය කර පහත වගුවේ සටහන් කරන්න.



❖ මෙම කැරපොතු ශිශුවන්ගේ වර්ධනය නිරීක්ෂණය කිරීමට නම් ඔවුන්ට බිස්කට් කැබලි වැනි ආහාරයක් ලබා දිය යුතුය.

| දිනය හා වේලාව | නිරීක්ෂණ | විශේෂ කරුණු |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

❖ ඔබගේ නිරීක්ෂණ මිතුරන් සමග හා විද්‍යාව භාර ගුරුතුමා සමග දුරකථන වැනි සන්නිවේදන මාධ්‍යක් භාවිතයෙන් සාකච්ඡා කරන්න.

## ක්‍රියාකාරකම 03

**අවශ්‍ය ද්‍රව්‍ය -**

ජෑම් බෝතල් 01, අත්කාවයක්, නෙට් රෙදි කැබැල්ලක්, යම් ශාකයක ආහාර ගනිමින් සිටින දළඹුවන් දෙදෙනෙකු පමණ.

## ක්‍රමය-

රූපයේ ආකාරයට ජෑම් බෝතලයට දළඹුවන් දෙදෙනෙකු පමණ ඇතුළු කර ඊට අමතරව ඔවුන් ආහාරයට ගන්නා කොළ වර්ගයක් ඇතුලත් කර දැල් රෙද්දෙන් ආවරණය කරන්න.



දිනපතා දළඹුවන්ගේ ලක්ෂණ නිරීක්ෂණය කරමින් පහත ආකාරයේ  වගුවක් සකස් කරගෙන නිරීක්ෂණ සටහන් කරන්න.


| දිනය හා වේලාව | දළඹුවන් තුළ ඇතිවන වෙනස්කම් | විශේෂ කරුණු |
|---|---|---|
| | | |
| | | |
| | | |

- ❖ ඉහත ක්‍රියාකාරකම අනුව සමනලයාගේ ජීවන චක්‍රයේ ඔබ දුටු අවස්ථා නම් කරන්න.

.......................................................................    .............................................................................

.......................................................................    ..............................................................................

## ක්‍රියාකාරකම 04



- ❖ ඉහත දැක්වෙන්නේ මිනිසාගේ ජීවන චක්‍රයයි. එම ජීවන චක්‍රය හා ඔබ ඉහත අධ්‍යයනය කළ සමනලයාගේ ජීවන චක්‍රය අතර පවතින වෙනස්කම් ලියා දක්වන්න.

.................................................................................................................................................................


.................................................................................................................................................................

රූපාන්තරණයක් සහිත ජීවන චක්‍රයක් යනු කුමක් දැයි පැහැදිලි කරන්න.

.................................................................................................................................................................

.................................................................................................................................................................

- ❖ රූපාන්තරණයක් සහිත ජීවන චක්‍රය හා රූපාන්තරණයක් රහිත ජීවන චක්‍රය නම් කරන්න.





.......................................................... ...........................................................

❖ රූපාන්තරණය, සම්පූර්ණ රූපාන්තරණය හා අසම්පූර්ණ රූපාන්තරණය ලෙස ආකාර දෙකකින් පවතී. ඒ සඳහා උදාහරණ වගුගත කරන්න.

| අසම්පූර්ණ රූපාන්තරණයක් ඇති සතුන් | සම්පූර්ණ රූපාන්තරණයක් ඇති සතුන් |
|---|---|
| | |
| | |
| | |
| | |


## ක්‍රියාකාරකම 05


❖ පහත සටහන සම්පූර්ණ කරන්න.

**ජීවන චක්‍ර අධ්‍යයනය කිරීමේ ප්‍රයෝජන**

- පලිබෝධ මර්ධනය සඳහා
- 
- 

❖ පහත ජීවන චක්‍රවල හිස්තැන් සම්පූර්ණ කරන්න.




❖ පහත පළිබෝධකයන් මර්ධනයේ දී වඩාත් පහසු වන්නේ ඔවුන්ගේ ජීවන චක්‍රවල කුමන අවස්ථා විනාශ කිරීම ද?

| පළිබෝධකයා | විනාශ කිරීමට වඩාත් පහසු ජීවන චක්‍රයේ අවස්ථාව |
|---|---|
| පළතුරු මැස්සා | |
| මදුරුවා | |

❖ ශාක වලට ද ජීවන චක්‍රයක් පවතී. පහත දැක්වෙන සපුෂ්ප ශාකවල ජීවන චක්‍ර යේ එක් එක් අවධි නම් කරන්න.




❖ ජෛව විවිධත්ව සංරක්ෂණය යනු කුමක් දැයි පැහැදිලි කරන්න.

.................................................................................................................................................

.................................................................................................................................................

❖ ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා ජීවන චක්‍ර යොදාගත හැකි ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................